# ටේරි සහ යාලුවන්ගේ අපූරු චාරිකාව



දිහන්සා හිමන්දී වීරක්කොඩි

# මේරි සහ යාලූවන්ගේ අපූරු චාරිකාව

දිහන්සා හිමන්දී වීරක්කොඩි

# මේරි සහ යාලුවන්ගේ අපූරු චාරිකාව

දිහන්සා හිමන්දී වීරක්කොඩි

පළමු දිග හැරීම

මහමායා බාලිකා විදුහල - මහනුවර
7 - E
2025-02-08
ISBN  NO. 978-624-208-730-6

# පිදුම

අප විදුහලේ ගරු විදුහල්පතිනිය ශශිකලා
සේනාධීර මැතිනියටත් මගේ ආදරණීය
අම්මාටත් , තාත්තාටත් මෙම ග්‍රන්ථය
පරිශීලනය කරන ඔබ
සැමටත් සෙනෙහසින්
පුදමි .

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන .හෙරණගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පටුන


1. සැන්ඩි සහ ලූවිස්ගේ පැමිණීම

2. සැන්ඩි ,ලූවිස්,  රොඩික් හා රෝසිව
   හමුවීම

3. එමලිවයි වින්ඩිවයි පිළිගැනීම හා
   සියල්ලෝම ගමනට පිටත්වීම

4. පාර වැරදීම

5. පාක් එකට යෑම

6. ආපසු නිවෙස් වෙත යාම

## 1. සැන්ඩි සහ ලූවිස්ගේ පැමිණීම

ටොක්! ටොක්! ටොක්! සැන්ඩි සහ ලූවිස් මේරිගේ ගෙදර දොරට තට්ටු කළේය.

“අනේ ළමයිනේ එන්න ඇතුලට මේරිනම් තවම එයාගේ සූට්කේස් එක ලෑස්ති කරනවා එයා එනකන් මම ඔය දෙන්නාට දොඩම් බීම දෙකක් හදන්නම්කෝ “ මේරිගේ මව ලූකස් මහත්මිය පැවසුවා.



“නැන්දේ තවම අනිත් අය අවේ නැද්ද ?” සැන්ඩි ඇසුවාය.

“ආහ්! රොඩිකුයි, රෝසියි, තව එයාලාගේ හුරතල් බල්ලා ජෝනුයි ඇවිල්ලා ඉන්නේ එයාලා උඩ තට්ටුවට ගියා ඔයාලත් කැමතිනම් උඩට යන්න” ලූකස් මහත්මිය පැවසුවාය.

සැන්ඩි ලූවිස් වේගයෙන් උඩ තට්ටුවේ තියෙන මේරිගේ කාමරයට දිව්වෝය.

“මේරි අපි ආවා” කියා සැන්ඩි මහ හයියෙන් මේරිගේ ඇගට පැන්නේය.

“අනේ සැන්ඩි ඔය විදියට පොඩි ළමයෙක් වගේ කෑ ගහන්න එපා මේක අපේ ගෙදර නෙමෙයිනේ.” ලූවිස් එයාගේ නැගණිය වන සැන්ඩිට බැන්නේය.

“හ්ම් ...... මම තාම පොඩි ළමයෙක් තමයි. මට තාම අවුරුදු 8 යි අනික මට අද යන චාරිකාව ගැන ඉවසිල්ලක් නැති නිසයි කෑ ගැහුනේ.”ඒ සැන්ඩි

“හරි හරි ඔය අයියගෙයි නංගිගෙයි රණ්ඩුව දැන්ම නවත්තගන්නයි කිව්වේ.” මේරි තරහෙන් කීවාය.

## 2. සැන්ඩි ,ලූවිස්,  රොඩික් හා රෝසිව හමුවීම

"ආහ් මේරි , කෝ රොඩිකුයි රෝසියි " ලූවිස් ඇසුවේය.

"ඒ දෙන්නා නං එහා කාමරේ සෙල්ලම් කරනවා . අපිත් යමුද?"  ඒ මේරි.

මේරියි සැන්ඩියි ලූවිසුයි එහා කාමරේට  ගොස් රොඩිකුයි රෝසියි මුණ ගැසුණා .

"හෙලෝ රොඩික්  , හෙලෝ රෝසි කොච්චර කාලෙකට පස්සෙද අපි අයේ හම්බුණේ"
සැන්ඩියි, ලූවිසුයි, රොඩිකුයි, රෝසියි එක්ක කතා කළා.

ටික වේලාවකින් , "ළමයි මෙන්න වින්ඩියි එමලියි ඇවිල්ලා. දැන් හැමෝම බඩු ටිකත් අරගෙන පහළට එන්න, දොඩම් බීම බොන්න" ලූකස් මහත්මිය කෑ ගැසුවාය.

සියලූ දෙනාම එකවර පහළට ඇවිත් වින්ඩියි එමලියි පිළිගත්තෝය.

## 3. එමලිවයි වින්ඩිවයි පිළිගැනීම හා සියල්ලෝම ගමනට පිටත්වීම

හෙලෝ ....! එමලි ,හෙලෝ ........!
වින්ඩි, සියලූ දෙනාම ඒ
දෙදෙනාව පිළිගත්තෝය.



"දැන් ඔයාලට තිබහත්
ඇතිනේ එහෙනම් මේ දෙඩම්
බීම එක බීලා ගමන යන්න
පිටත් වෙන්න."
ලූකස් මහත්මිය කීවාය.

සියලූ දෙනා එක හුස්මට බීම වීදුරුව බී ගමන යන්න
පිටත් වූවෝය.
"එහෙනම් අපි ගිහිල්ලා එන්නම් ලූකස් නැන්දේ බායි"
"අම්මේ අපි ගිහින් එන්නම්" මේරි සහ ඇයගේ යහලූවන්
ලූකස් මහත්මියට සමු දී ගමන් යන්න ඔවුන්ගේ බයිසිකල්
සූදානම් කර පිටත් වුණෝය.
ජෝනුත් ඔවුන් පස්සෙන් දුවගෙන අවේය.

“අනේ මට හරි බඩගිනියි”  ටික දුරක් ගොස් එමලි එසේ කීවාය .

“මටත් දැන් ටිකක් බඩගිනියි “ඒ මේරි

ඉන් පසු සියල්ලූ දෙනාම මේරීගේ අම්මා සාදා දුන් පාන් කන්න පටන් ගත්තෝය. ඒ වෙලාවේ ජෝන් බව් බව් ගා කෑ ගැසුවේය.

“අනේ සොරි ජෝන් මට ඔයාට පාන් කෑල්ලක් දෙන්න අමතක වුණානේ “ රෝසිත් එසේ කියමින් ජෝන්ට පාන් කෑල්ලක් දුන්නේය.

“අපේ අම්මා මට කේක් කෑලි 10ක් දුන්නා ඔයාලත් එක්ක කන්න කියලා” ෆ්‍රැන්සිස් මහත්මිය සාදා දුන් කේක් කෑලි එළියට ගනිමින් රෝසි එසේ කීවාය.

"අම්මෝ මේ කේක් එක මාර රසයිනේ ඔයාලාගේ අම්මාද හැදුවේ" කේක් කෑල්ලේ රස වැටුණු සැන්ඩි ඇඟිලි උරමින් කීවාය.

"ඊයා සැන්ඩි ගෙදරින් පිට ඉන්නකොට ඇඟිලි උරන්න එපා" ඒ ලූවිස්. "අනේ ඔයා පාඩුවේ ඉන්නකෝ" සැන්ඩි එසේ කීවාය.

ඒ වේලාවේ සියල්ලෝම අයියාගෙයි නංගිගෙයි රණ්ඩුවට හිනාවුණා.

ඉන් පසු සියලූ දෙනාම ආපසු ගමන යන්න පිටත් වුණා .



# 4. පාර වැරදීම

ටික දුරක් යන විට යහලුවන් හය දෙනාට හතරමං හන්දියක් හම්බවුණි.

"අයියෝ මේරී අපි දැන් කොයි පැත්තටද යන්න ඕනේ අපි අතරමං වෙලාද ? " එමලි අතරමං වුණා කියා සිතා එසේ කීවාය.

"මාත් හරියටම දන්නේ නෑ අපි දකුණු පැත්තට යමු." මේරි පැවසූවාය.

සියලූ දෙනාම දකුණු පැත්තේ තිබුණු පාරේ යන්න පටන් ගත්තා.

"අ....... අනේ .... මේරී , ම... ම.... මේ........ පාර මෙතනින් ඉවරයිනේ . අපි අතරමං වෙලාද ? "එමලි බයෙන් වෙව්ල වෙව්ල කීවාය.



“මේ....... මේ...... මම කියන්නේ අපි වැරදි පාරක ඇවිල්ලා තියෙන්නේ “ මේරිත් වේවලමින් එසේ කීවාය.

“ අනේ අපිට ආයේ හැරිලා ආපසු හරි පාරේ යන්න තමයි වෙන්නේ. මේරී ඔයා ලග සිතියමක් නැත්ද රොඩික් ඇසුවේය.

“ආහ් ..! ඔව් මේරි මම දැක්කා ඔයා සූට් කේස් එක අස් කරද්දි සිතියමක් දානවා.” රෝසි තිගැස්සී එසේ කීවාය.

“අයියො.... මට අමතක වුණානේ මම සිතියම ගත්තනේ” මේරී ලැජ්ජාශීලී මූනක් දමමින් සිතියම සූට්කේස් එකෙන් එලියට ගත්තා.

“අනේ පව් මේ බලන්න මගේ සුදු ජෝන් පැටියට හොදටම හති. අනේ මන්දා  කලූ පාට බූල් කබායක් දාගෙන මේ රස්නේ කොහොම ඉන්නවාද මන්දා.” රොඩික් ජෝන්ගේ ඔලූව අතගාමින් කීවේය.

“අනේ.... අනේ ....රොඩික්, ජෝන් සුදු නෑනේ ” ලූවිස් එසේ කීවේය.

“හරි හරි ඉතින් ආදරේටනේ කිව්වේ .” රොඩික් අමුතු මුහුණක් හදාගෙන එසේ කීවේය.

“සිතියමේ විදිහට නම් අපි ආපහු අර හතරමං හන්දියට යන්න ඕනේ. ඊට පස්සේ වම් පැත්තට යන්න ඕනේ.” මේරි පුදුමයෙන් කීවාය.

ඒ වෙලාවේ සියලූ දෙනාම බයිසිකල් ලෑස්ති කරගෙන ආපහු හතරමං හන්දියට ආවෝය.


“හරි දැන් මේ හතරමං හන්දියෙන් වමට දාලා කෙලින් යන්න ඕනේ.” මේරි එසේ කීවාය පස්සේ සියලූ දෙනාම වමට දමා කෙලින් ගියෝය.

“අනේ දෙවියනේ අර දිය ඇල්ලක් නේද ?”
“මෙතන මාර ලස්සනයිනේ අපි මෙතනද නවතින්නේ ? ”
සැන්ඩි පුදුමයෙන් ඇහුවාය.

“ඔව් ඔව් මෙතන තමයි අපි නවතින්නේ”.
මේරි පැවසුවාය.

“අනේ මේ බලන්න
මෙතන ලස්සන දිය
ඇල්ලක් තියනවා.”
රොඩික්
ඉවසිල්ලක් නැතිව
කෑ ගැසුවා.

ජෝන් දිය ඇල්ල දැක්ක
ගමන්ම ජබුස් ගාලා
දිය ඇල්ලට
පැන්නා.
“අනේ ...අනේ ...
ජෝන් ඔයත්
මාර වැඩ තමයි
කරන්නේ”
රොඩික් හිනා වෙවී
එසේ කීවේය.



“හරි දැන් අපි අපේ බයිසිකල් පැත්තකින් නවත්තලා අපි ගෙනාපු කූඩාරම් ටික ගහමු .”මේරී කීවාය.

“ඔන්න මම නම් මේරිත් එක්ක මේරිගේ කූඩාරමේ ඉන්නවා.” සැන්ඩි මේරිව බදාගෙන කීවාය.

“හරි හරි දන් අපි ඉක්මනට කූඩාරම් ටික ගහමු. වින්ඩි රොඩික් ඔයාලා කූඩාරම් ගෙනාවා නේද?”
මේරි ඇසුවේය

“ඔව් මේරි කූඩාරම් නම් ගෙනාවා.” වින්ඩියි රෝසියි කීවෝය .

“මේ ඒත් මේරි අපි කොහොමද අද කෑම ගත්තේ අපි මොකුත් කෑම ගෙනාවේ නැනේ .”


“හරි හරි බය වෙන්න දෙයක් නෑ ඔය ඉස්සරහ තියෙන පාරේ කෙලින්ම අඩි හතරක් පහක් යනකොට තියෙනවා ලොකු පාර්ක් එකක් අපි ලග සල්ලි ගොඩක් තියෙන නිසා අපි ඒ පාර්ක් එකෙන් කෑම අරන් එමු.” මේරී කීවාය.

“මේරී අපිට සෙල්ලම් කරන්න පුලුවන්ද?” සැන්ඩි ඇසුවාය.

“බලමුකෝ ...! බලමුකෝ ...! “මේරී එසේ කීවාය.

“හරි එහෙනම් කතා කරා ඇති අපි කූඩාරම් ටික ගහමුකෝ.”

ඉන් පසු සියල්ලෝම කූඩාරම් ගසා ඔවුන්ගේ සූට්කේස් කූඩාරම් ඇතුලට දැම්මේය



“එහෙනම් ළමයි ඉක්මණට ඇදුම් මාරුකරගෙන එන්න අපි දිය ඇල්ලට යං නාන්න.”

“ඒ යාලුවනේ කෝ ජෝන් “ රොඩික් ඇසුවේය.

“අර ඉන්නේ දිය ඇල්ලේ පීන පීන. “ රෝසි රොඩික්ට ජෝන්ව පෙන්නුවේය.

ඉන්පසු සියල්ලෝම ඇඳුම් මාරුකරගෙන කූඩාරමෙන් එළියට ආවෝය. “එහෙනම් අපි එකට දිය ඇල්ලට යමු .” රෝසි කීවාය.
1,2,3 කියලා ඔවුන් සියලූ දෙනාම දිය ඇල්ලට පැනලා පැයක් විතර දිය ඇල්ලේ පීන පීන හිටියෝය.
පීන පීන හිටියට පස්සේ සැන්ඩිට බඩගින්නක් ආවා විතරයි ,

“මේරි දැන් වේලාව කීයාද?”
“දැන් වේලාව හරියටම හවස 4යි” මේරී වේලාව කීවාය.



අනේ අපි ගොඩක් වෙලා දිය ඇල්ලේ පීන පීන හිටියනේ තව ටිකක් හිටියොත් අපිව දිය වෙන්නත් බැරි නෑ"
ලූවිස් කීවේය .

ඉන් පසු සියලූදෙනාම ගොඩට ඇවිත් ඔවුන්ගේ කූඩාරම් වලට ගොස් ඇඳුම් මාරුකරගෙන එළියට ආවෝය

"මේරි අපි දැන් පාක් එකට යමුද ?"සැන්ඩි ඇසුවාය.
ම් ....... අපි තව ටිකකින් යමු නේද? 4.30ට විතර"
මේරී කීවේය.

ඊට විනාඩි 5කට පසු මේරි දැන් 4යි තිහයි අපි දැන් යමුද?"
සැන්ඩි ඉවසිල්ලක් නැතුව කෑ ගැසුවාය.

"හා හා අපි දැන් යමුකෝ ..."

"එන්න හැමෝම අපි දැන් පාක් එකට යනවා." මේරි කෑ ගැසුවේය .

## 5 පාක් එකට යෑම

මීටර් 100ක් විතර පයින් ඇවිද ගිය පසු සියලූ දෙනාම පාක් එක දැක්කා.

" බුදු අම්මෝ ලස්සන මේ පාක් එක පුදුම ලස්සනයිනේ.
බලන්න මල් ගොඩක් පිපිලා.
ඒ මදිවට පාක් එක මැද තඩි වැවක් ."
සැන්ඩි ඉවසිල්ලක් නැතිව හිස හැරුණු අතේ දිව්වාය .

අනිත් අයත් සැන්ඩි පස්සෙන් දිව්වෝය.

"ඊට පසු සැන්ඩි එයා ලග තිබ්බ මැරිගෝරවුන්ඩ් එක ළග නැවතිලා "මට මේකේ යන්න ඕනේ.
ආ ....... ඊට කලින් මට අර බොම්බයි මොටයි
එකක් අරන් දෙනවාද ?"
සැන්ඩි ඇසුවාය.

ඉන් පසු මේරි
සැන්ඩිට බොම්බයි
මොටයි එකක්
අරන් දීලා
මැරිගෝරවුන්ඩ්
එක ළගට
එක්කන් ගියාය



" හරි අපි කෑම අරන් එනකන් ඔයා වින්ඩියි එමලියි එක්ක මැරිගොරවුන්ඩ් එකේ යන්න."

මේරි සැන්ඩිව මැරිගෝ්රවුන්ඩ් එකේ තියලා කෑම අරන් එන්න ගියාය.

විනාඩි 15කට පමණ පස්සේ මේරි අනික් අයත් එක්ක මැරිගෝ්රවුන්ඩ් එක ළගට ගියාය. ඒ වෙනකොටත් සැන්ඩි මැරිගෝ්රවුන්ඩ් එකේ .

"දැන් ඇති නේද සැන්ඩි අපි දැන් යමු කතුරු ඔංචිල්ලාවේ. රෝ්සි සැන්ඩිව මැරිගොරවුන්ඩ් එකෙනේ බස්සලා සියලූ දෙනත් එක්ක කතුරු ඔංචිල්ලාවට ගියෝ්ය.

සියලූ දෙනාම ටිකට් එකතු කරන්නාට ටිකට් ටික දීලා කතුරු ඔංචිල්ලාවේ ගියෝ්ය. කතුරු ඔංචිල්ලාවේ ගිහිල්ලා එතනින් බැස්ස පසු අයියෝ මට තාමත් කැරකිල්ල වගේ ලූකස් කීවේය.

“සියලූ දෙනාම ඔහුට හිනා විය. එහෙනම් අපි යමු නේද දැන් 6.30ටත් ලගයි.” මේරි කීවාය.

ඉන් පසු සියලූ දෙනාම ඔවුන් සිටි තැනට ගොස් ගිණිමැලයක් ගසා ලී කොට මත වාඩි වී සින්දු කිය කියා ආහාර ගත්තේය.

ඔන්න එහෙනම් මම සින්දුවක් කියනවා “ සල්ලි සල්ලි දෙයියන්ගේ මල්ලි “

සැන්ඩි ගම දෙවනක් කර මහ හයියෙන් සින්දු කිව්වාය. සියලූ දෙනාම කන් වහගත්තේය.

පැය භාගයකට පමණ පස්සේ සියලූ දෙනාම නිදාගන්න කූඩාරම් ඇතුලට ගියෝය

“ගුඩ් නයිට් යාලූවනේ “ මේරී කීවාය

## 6 ආපසු නිවෙස් වෙත යාම

උදෑසන උදා විය . මේරි මුලින්ම ඇහැරුණාය. " ළමායි අපි තව ටිකකින් යන්න ඕනේ." මේරි කෑ ගැසුවාය

ඉන් පසු රෝසි සහ එමලි ඇහැරුණෝය .

"කෝ එමලි අපි ගෙනාපු තේ බෝතලය." මේරි ඇසුවාය

"ආ ... මෙන්න.
මම වත්කරලා දෙන්නම් " එමලිත් තේ වත්කරමින් කීවාය

ඉන් පසු මේරි සහ රෝසි සියලූ දෙනාවම ඇහැරවෝය.
ටික වේලාවකින් සියලූ දෙනා තේ බී දිය ඇල්ලට පැන්නෝය.
"බුදු අම්මෝ මේ වතුර මාරි සීතලයිනේ මාව වෙව්ලනවානේ ."රොඩික් පැවසුවාය.

"අපිටත් සීතලයි තමා අනේ අනිත් යාළුවෝ රොඩික්ට පැවසුවෝය."

පැයකට විතර පසු

"දැන් නෑවා ඇති නේද අපිට යන්නත් ඕනේ "මේරි පැවසුවාය.

ඉන් විනාඩි 5කට පසු සියලූ දෙනාම ගොඩට ඇවිත් ඇඳුම් මාරුකරගත්තෝය.

"මේ මට හරි බඩගිනියි අපි අර ඊයේ ගත්ත බිස්කට් එක කමුද?" වින්ඩි ඇසුවාය.

"කමු කමු....."සියලූ දෙනාම එක හඩින් පැවසුවෝය.



බිස්කට් කා........... තේ බී විනාඩි 10කට පසු ඔවුන් ගෙනා බඩුත් ලෑස්ති කරගෙන ආපසු නිවෙස් බලා ගමන් කළෝය.
ජෝනුත් ඔවුන් පස්සේ ගියේය.

පැයකට පසු සියලු දෙනාම මේරිගේ ගෙදරින් නැවතුනා.

“එහෙනම් මම යනවා ඔයාලාත් ගේ ඇතුළට එනවාද ?” මේරි ඇසුවා.

“අපිත් මෙහෙම් ගෙදර යන්නම් අපේ අම්මලා බලන් ඇති” යාලුවන් කීවෝය.

“බායි ........” මේරි සියලු දෙනාම මේරිට බායි කියා නිවෙස් වෙත ගියෝය.

මේ කතාව කියවූ ඔයාලටත් බායි . අපි යනවා...

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍යය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියායාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN NO. 978-624-208-730-6